සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව **ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் **இலங்கைப் பரீட்சைத் திணைக்களம்** இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
**General Certificate of Education (Adv. Level) Examination, August 2012**

**නව නිර්දේශය**
**புதிய பாடத்திட்டம்**
**New Syllabus**

| | |
|---|---|
| **බුද්ධ ධර්මය** | I |
| **பௌத்தம்** | I |
| Buddhism | I |

**41 S I**

**පැය දෙකයි**
*இரண்டு மணித்தியாலம்*
*Two hours*

**උපදෙස්:**

- ※ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ **ඔබේ විභාග අංකය** ලියන්න.
- ※ උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට **(1), (2), (3), (4), (5)** යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන එය උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**
- ※ එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** යි.

1. පසුගිය වෙසක් පොහොයට පෙරදින කැන්දහේන ජාතික පාසලේ පැවැති ආගමික කටයුතු අතර භාවනා වැඩසටහනක් ද විය. පළමුව බුද්ධානුස්සති භාවනාව වැඩූ අතර අනතුරුව පැවැතියේ ඒ පිළිබඳ සාකච්ඡාවකි. සමකාලීන මහණ බමුණන් අතර බුදුරදුන්ගේ විශේෂත්වය ගැන එහි දී ප්‍රකාශ වූ අදහස් කිහිපයක් පහත දැක්වේ. ඉන් නිවැරදි අදහස ලෙස සැලකිය හැක්කේ,
   (1) බුදුරජාණන් වහන්සේ සෙසු මහණ බමුණන් පිළිගත් දෘෂ්ටි පසෙක ලා නව දෘෂ්ටියක් ඉගැන්වූහ යන්නයි.
   (2) උන්වහන්සේ සෙසු සාමයික ඉගැන්වීම් සපුරා අසත්‍ය යැයි වදළහ යන්නයි.
   (3) භාවනා මගින් සිත එකඟ කළ හැකි යැයි ඉගැන්වූයේ බුදුරදුන් පමණකි යන්නයි.
   (4) පිණ්ඩපාතයෙන් ම යැපීම බුදුරදුන්ගේ සුවිශේෂී පිළිවෙතක් විය යන්නයි.
   (5) ඇතැම් මහණ බමුණන් ශීලව්‍රත අනුගමනය කිරීමට ඉගැන්වූ නමුදු බුදුරදුන් එය සංයෝජනයක් ලෙස පෙන්වා දී ඇත. යන්න යි.

2. බුදුරජාණන් වහන්සේගේ රූපකායෙහි ප්‍රකට වූ සුවිශේෂ ලක්ෂණ පිළිබඳ ව විස්තර වන ලක්ඛණ සූත්‍රය අනුව මහාපුරුෂයකුගේ යටිපතුල්හි දහසක් අර ඇති නිම්වළලු සහිත නාභි සහිත හැම අයුරින් ම පිරිපුන් මැනවින් බෙදී ගිය පරතරය ඇති ලකුණු පහළ වේ. මින් කියැවෙන සුවිශේෂ ලක්ෂණ හැඳින්වෙන්නේ,
   (1) ආයතපණ්හි යන්නෙනි.
   (2) මුදුතලුනහත්පාද යන්නෙනි.
   (3) පාදතලෙසු චක්කලක්ඛණං යන්නෙනි.
   (4) සුප්පතිට්ඨිතපාද යන්නෙනි.
   (5) ජාලහත්පාද යන්නෙනි.

3. ලෝකය ශාස්වත ද ලෝකය අශාස්වත ද යනාදී ප්‍රශ්න දහය සමකාලීන මහණ බමුණන් අතර නිතර විමසුමට ලක්වූ නමුදු බුදුරජාණන් වහන්සේ ඒ කිසිවක් දුකින් මිදීමට අදාළ නො වන බව පෙන්වා දුන්හ. ඒ පිළිබඳ ව බුදුරජාණන් වහන්සේ අනුගමනය කළ පිළිවෙත හැඳින්වෙන්නේ,
   (1) විභජ්ජව්‍යාකරණීය යනුවෙනි.
   (2) ඨපනීය යනුවෙනි.
   (3) අට්ඨුප්පත්තික යනුවෙනි.
   (4) යොනිසො මනසිකාර යනුවෙනි.
   (5) පුච්ඡාවසික යනුවෙනි.

4. ගුවන්විදුලි ධර්මදේශනයක දී බුදුරජාණන් වහන්සේගේ ගුණ මහිමය වර්ණනා කරමින් විස්ස්මානවිකාවගේ පුවත ඉදිරිපත් කෙරිණ. එහි අවසනට සඳහන් වන අනඳ හිමියන් හා බුදුරදුන් අතර ඇති වූ සංවාදයෙන් ප්‍රකාශ වන්නේ බුදුරදුන් තුළ පැවැති,
   (1) පුරිසදම්මසාරථී ගුණයයි.
   (2) අසමසම සීල ගුණයයි.
   (3) තාදී ගුණයයි.
   (4) මහා ප්‍රඥවයි.
   (5) ධම්මානුපස්සනාවයි.

5. බුදුරජාණන් වහන්සේ හා රහතන් වහන්සේ යන දෙදෙනා සියලු දුක් නිම කළ බැවින් සමාන වන බව බැලූ බැල්මට පෙනේ. එහෙත් බුදුරජාණන් වහන්සේට පමණක් සීමා වූ ඥාණ විශේෂයක් ද ඇත. එය නම්,
   (1) ආසවක්ඛය ඥාණයයි.
   (2) මහාකරුණාසමාපත්ති ඥාණයයි.
   (3) ඉද්ධිවිධ ඥාණයයි.
   (4) පරචිත්තවිජානන ඥාණයයි.
   (5) දුක්ඛනිරොධ ඥාණයයි.

6. බුදු දහම ගැන කථාවක් කළ පාසල් ශිෂ්‍යයකු විසින් එය උච්ඡේදවාදී නො වන බවත් ලෝකය අශාස්වත යැයි එහි කියවී නැති බවත් පරලොවක් නැතැයි පිළිගැනීමට බුදු දහම අකැමැති බවත් පැහැදිලි කරන ලදී. මේ තත්ත්වය බුදු දහමේ විශේෂ ලක්ෂණයකැයි පැවසූ ඔහුගේ මතය වූයේ,
   (1) බුදු දහම අනුව භවගාමී ආත්මයක් ඇත යන්නයි.
   (2) ශාස්වතවාදයට බුදු දහම කෙළින්ම විරුද්ධ ය යන්නයි.
   (3) සියල්ල අනිත්‍ය වුව ද සත්ත්වයා දිගින් දිගට සසර ගමන් කරයි යන්නයි.
   (4) මියයන තැනැත්තා ම නැවත උපදී යන්නයි.
   (5) බුදු දහම අනාත්ම ධර්මයකි යන්නයි.

[ දෙවැනි පිටුව බලන්න.

7. බුදු දහම දේව කේන්ද්‍රීය, දේව ධර්ම හෝ දේවානාවරණ යන පදවලින් හැඳින්විය නොහැකි ය. එය මිනිසාගේ හිතසුව පිණිස උතුම් මිනිසකු විසින් දේශිත ධර්මයකි. ඉන් ඉගැන්වෙන විමුක්තිය ළඟාකර ගත හැක්කේ ද මිනිසකුට ම ය. මේ අනුව නිවැරදි අදහස වන්නේ,
   (1) ත්‍රිපිටකයේ කිසිදු තැනක දෙවිදේවතාවුන් ගැන කියවී නැත යන්නයි.
   (2) මතු බුදුවන දෙවිවරුන් පමණක් බෞද්ධයන් විසින් විශ්වාස කළ යුතු ය යන්නයි.
   (3) දේව ඇදහිලි දුකින් මිදීමට උපකාර නො වේ යන්නයි.
   (4) බුදුරජාණන් වහන්සේ සමකාලීන දේව විශ්වාස සියල්ල තදින් විවේචනය කළහ යන්නයි.
   (5) බෞද්ධ දෙවිවරුන් ගැන පමණක් අප විශ්වාස තැබිය යුතු ය යන්නයි.

8. අනුස්සව ආදිය නොපිළිගැනීමටත් තම තමා විසින් කුසලාකුසල දත යුතු බවටත් කාලාම සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ දී ඇති උපදෙස්වලින් පැහැදිලි වන්නේ,
   (1) සියලු සාම්ප්‍රදායික ඥාන මාර්ගවලට බුදු දහම සපුරා විරුද්ධ බව ය.
   (2) බුදු දහමෙහි ඉගැන්වෙන සිතීමේ හා විමසීමේ නිදහස සියලු සීමා බැහැර කොට ඇති බව ය.
   (3) වෛදික බමුණන් මෙන් සම්ප්‍රදායකට ගැති නොවී සිටීමට පමණක් බුදුරදුන් අනුශාසනා කරන බව ය.
   (4) ත්‍රිවිධ රත්නය හැර අන් සියලු කරුණු පිළිබඳ ව විමසීමට බෞද්ධයකුට නිදහස ඇති බව ය.
   (5) සිතීම හා විමසීම වගකීමෙන් තොර නිදහසක් හැටියට බුදු දහම අදහස් නොකරන බව ය.

9. "සන්දිට්ඨික" යන පදයෙන් කියැවෙන ධර්මරත්නයේ ගුණය කවර අර්ථයක් ප්‍රකාශ කරන්නේ ද යන කාරණය පිළිබඳ ව අටසිල් සමාදන්ව සිටි උපාසක - උපාසිකාවන් අතර ඇති වූ සාකච්ඡාවක දී පහත සඳහන් අදහස් ප්‍රකාශ විය. ඉන් නිවැරදි වන්නේ,
   (1) මෙලොව දී ම අත්දැකීමෙන් දත හැකි බවයි.
   (2) දහම අවබෝධ කිරීමෙන් පමණක් නිවන් පසක් කළ හැකි බවයි.
   (3) බුදුරජාණන් වහන්සේ විසින් මේ දහම ප්‍රත්‍යක්ෂයෙන් දත් බවයි.
   (4) බුදුන් වදළ දහම අන් දෘෂ්ටිගතිකයකුට දැනගත හැකි නො වන බවයි.
   (5) බුදු දහම සම්‍යග් දෘෂ්ටියක් බවයි.

10. උභයලෝකාර්ථ සංවර්ධනය අගය කිරීම සහ ඒ සඳහා උපදෙස් දීම බුදු දහමේ විශේෂ ලක්ෂණයකි. මේ අනුව බුදු දහම, පරලොව සැපතට පමණක් මිනිසුන් යොමුකෙරෙන ඉගැන්වීමක් හැටියට හැඳින්විය නොහැකි ය. මෙලොව සහ පරලොව සංවර්ධනය එක සේ ඉගැන්වෙන සූත්‍රකට බුද්ධ දේශනාව,
   (1) දම්සක් පැවතුම් සූත්‍රයයි. (2) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයයි. (3) සම්මාදිට්ඨි සූත්‍රයයි.
   (4) කරණීයමෙත්ත සූත්‍රයයි. (5) සභිය සූත්‍රයයි.

11. බෞද්ධ පැවිද්ද බුද්ධකාලයේ සිට ම විකාශයට පත් වූ සංස්ථාවකි. එම විකාශයේ දෙවන අවස්ථාවේ දී ඇතිවූයේ,
   (1) සාමණේර පැවිද්දයි. (2) අට්ඨගරුධම්ම පටිග්ගහණ පැවිද්දයි. (3) සරණාගමන පැවිද්දයි.
   (4) භික්ඛුණී පැවිද්දයි. (5) ඒහිභික්ඛු පැවිද්දයි.

12. සංඝරත්නය වැඳීමට යොදාගැනෙන පාඨයෙහි සංඝයාගේ ගුණ අතර "ආහුනෙය්‍ය" යන්න ද වේ. එහි ධර්මානුකූල අර්ථය වන්නේ,
   (1) වැඩමවා දන්දීමට සුදුසු යන්නයි. (2) සහසතු කොට දන් පිළිගැන්වීමට සුදුසු යන්නයි.
   (3) දහම්කරුණු අසාගැනීමට සුදුසු යන්නයි. (4) සිව්පසය පිළිගැනීමට සුදුසු යන්නයි.
   (5) වැඩසිටින තැනට ගොස් පූජා කිරීමට සුදුසු යන්නයි.

13. බුදුරජාණන් වහන්සේ විනය ශික්ෂා පැනවීමට කාලයක් ගත් බව බෞද්ධ මූලාශ්‍රයවල සඳහන් වේ. සාරිපුත්‍ර මහරහතන් වහන්සේ විනය ශික්ෂා පනවන්නැයි බුදුරදුන්ගෙන් ඉල්ලා සිටි විට බුදුරජාණන් වහන්සේ දෙසා වදාරන්නේ සංඝයා වහන්සේ අතර ආසවට්ඨානීය ධර්ම පහළ වූ පසු විනය ශික්ෂා පනවන බව ය. මේ කියන ධර්ම සංඛ්‍යාවට ඇතුළත් **නො වන්නේ,**
   (1) දැනඋගත් භික්ෂූන් බහුල වීම ය. (2) සසුනට උපදින ලාභ ප්‍රයෝජන වැඩි වීම ය.
   (3) වැඩිහිටි භික්ෂූන් බහුල වීම ය. (4) බ්‍රහ්මචර්යයට කැලැල්වන පරිදි ක්‍රියාකිරීම ය.
   (5) සාමාජික සංඛ්‍යාව වර්ධනය වීම ය.

14. අඩමසකට වරක් සම්මත සීමාවක දී උපෝසථ කර්මය කළ යුතුයැ'යි බුදුරජාණන් වහන්සේ විසින් භික්ෂූන්ට අනුදැන වදරා ඇත. එවැනි උපෝසථ කර්මයක දී පෙරකිස නිමවන භික්ෂූන් වහන්සේලා,
   (1) ප්‍රාතිමෝක්ෂය දේශනා කරති.
   (2) භික්ෂු අධ්‍යාපනය ගැන සාකච්ඡා කරති.
   (3) රෝගී භික්ෂූන් වහන්සේලාට උපස්ථාන කරති.
   (4) දහම් පාසල් සංවර්ධනයට විධිවිධාන යොදති.
   (5) බුදුසසුනට ඇති අභියෝග මොනවාදැ'යි හඳුනාගනිති.

15. උපසපන් භික්ෂුවක විසින් සමාදන්ව විසිය යුතු ශික්ෂාපද මොනවාදැ'යි භික්ෂු ප්‍රාතිමෝක්ෂයෙහි සඳහන් වේ. ඒ අතුරෙන් භික්ෂුත්වය අහිමි කරන විනය විරෝධී ක්‍රියා, සතර පාරාජික ධර්ම යනුවෙන් හැඳින්වේ. පහත දක්වෙන කරුණු අතුරෙන් පාරාජික ධර්මයක් වන්නේ,
   (1) සෙසු භික්ෂූන් සමඟ කලහ කිරීම ය. (2) සතුන් මැරීම ය.
   (3) තමා තුළ නැති ගුණ ඇතැයි කීම ය. (4) සහසතු දේපළ අනිසි ලෙස පරිහරණය කිරීම ය.
   (5) මත්පැන් මත්ද්‍රව්‍ය භාවිත කිරීම ය.

16. ප්‍රථම ධර්ම සංගායනාවට හේතු වූ කරුණු රාශියක් මූලාශ්‍රයවල සඳහන් වේ. ඒ අතුරෙන් එකක් ලෙස සැලකිය **නො හැක්කේ,**
(1) බුද්ධ පරිනිර්වාණයෙන් පසු ධර්මය සහ විනය එක්රැස්කර සංවිධානය කිරීම ය.
(2) අනඳ මහරහතන් වහන්සේට විරුද්ධව ඉදිරිපත් කෙරුණු චෝදනා සලකා බැලීම ය.
(3) සුභද්‍ර භික්ෂුවගේ අභද්‍ර වචනය ය.
(4) බුදුරදුන් ධරමාන කාලයේ පවා පැවැති මතභේද ය.
(5) එකල ජීවත් වූ රජදරුවන් ශාසනික තත්ත්වය ගැන කලකිරීමට පත්ව සිටීම ය.

17. දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල රාශියකි. ඒ සියල්ල ශාසන ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයක් වෙත අපේ අවධානය යොමු කරවයි. ඉන් වැදගත් කරුණක් වන්නේ,
(1) අභිධර්ම පිටකය පහළ වීම ය. (2) භික්ෂු සංඝයා අතර සමඟිය භින්න වීම ය.
(3) මහායාන බුදු දහම පහළවීම ය. (4) විනයධර භික්ෂූන්ගේ බලය පිරිහීයාම ය.
(5) කුඩා - අනුකුඩා ශික්ෂා පද පිළිබඳ එකඟත්වයක් ඇති නොවීම ය.

18. බුදුරජාණන් වහන්සේ පිරිනිවීමට ආසන්න සමයේ කුඩා - අනුකුඩා ශික්ෂාපද සමූහනය කිරීමට භික්ෂූන් වහන්සේලාට අවසර දුන්හ. එහෙත් ප්‍රථම ධර්ම සංගීතියේ දී එම ශික්ෂා පද මොනවාද'යි තීරණය නොකෙරිණි. ගිහියන්ගෙන් එල්ලවිය හැකි චෝදනා සැලකිල්ලට ගැනීම ඊට හේතුව විය. කුඩා - අනුකුඩා ශික්ෂාපද කැඩීමට බුදුරදුන් දුන් අවසරය සඳහන් වන්නේ,
(1) නිකායසංග්‍රහයේ ය. (2) සමන්තපාසාදිකාවේ ය. (3) දීපවංසයේ ය.
(4) දීඝනිකායේ ය. (5) චුල්ලවග්ගපාළියේ ය.

19. පාලි අටුවා සහ වංසකථා අනුව ධර්මාශෝක මහරජතුමා සැට දහසක් අන්‍ය තීර්ථකයන් සසුනෙන් නෙරපා හැරීමට ද ශේෂ වූ භික්ෂූන් වහන්සේලා බුදු දහම අනුව ශික්ෂණය ලැබූ හැටියට තීරණය කිරීමට ද ඉදිරිපත් කරනු ලැබූ පැණය බුදුරජාණන් වහන්සේ කවර වාදියෙක් ද? යන්නයි. මේ පැණයට නිවැරදි පිළිතුර හැටියට පිළිගැනෙන්නේ,
(1) යථාර්ථවාදියෙකි යන්නයි. (2) විභජ්ජවාදියෙකි යන්නයි.
(3) හේතුඵලවාදියෙකි යන්නයි. (4) විනයවාදියෙකි යන්නයි.
(5) අනාත්මවාදියෙකි යන්නයි.

20. තුන්වන ධර්ම සංගායනාවෙන් පසු විවිධ රටවලට ධර්මදූතයින් පිටත්කර යැවුණු බව ශාසනික වාර්තාවල සඳහන් වේ. ඒ අතුරෙන්, ස්වර්ණභූමි නමින් හැඳින්වුණු වර්තමාන මියන්මාර් දේශයට වැඩම කළ ධර්මදූතයන් වහන්සේලාගේ ප්‍රධානත්වය උසුලන ලද්දේ,
(1) මජ්ඣන්තික මාහිමියන් විසිනි. (2) ධම්මරක්ඛිත මාහිමියන් විසිනි.
(3) සෝණ, උත්තර මාහිමිවරුන් විසිනි. (4) මහාමහින්ද මාහිමියන් විසිනි.
(5) මහාදේව මාහිමියන් විසිනි.

21. බුදුරදුන් විසින් උපසපන් භික්ෂූන් වහන්සේලා සඳහා පනවන ලද විනය ශික්ෂා වරින්වර සංශෝධනය වූ අතර ප්‍රථම ධර්ම සංගීතියේ දී ඒ සියල්ල සංගායනා කොට ක්‍රමානුකූලව සංග්‍රහ කරන ලදී. එම සංග්‍රහය තුළ විනය ශික්ෂා විවිධ කොටස්වලට වර්ග කොට ඇත. එම වර්ගීකරණයට ඇතුළත් **නො වන්නේ,**
(1) සංඝාදිසේස ය. (2) නිස්සග්ගිය පාචිත්තිය ය. (3) නීවරණ ය.
(4) අනියත ය. (5) සේඛියා ය.

22. සූත්‍ර පිටකය හඳුන්වා දෙමින් කෙටි වාක්‍ය පහක් ලිවීමට අ.පො.ස. (උසස් පෙළ) හදාරණ සිසු - සිසුවියන් පිරිසකට නියම කෙරිණි. ඉන් එක් ශිෂ්‍යයකු වන සිරිසෝම ඉදිරිපත් කළ පිළිතුරෙහි එක් ප්‍රකාශයක් පමණක් නිවැරදි විය. එම ප්‍රකාශය වූයේ,
(1) සූත්‍ර පිටකය සම්මුති සහ පරමාර්ථ දේශනාවලින් යුක්ත ය යන්නයි.
(2) එහි බුද්ධභාසිත මෙන් ම ශ්‍රාවකභාසිත ද ඇතුළත් වේ යන්නයි.
(3) දීඝනිකායට ග්‍රන්ථ පහළොවක් ඇතුළත් ය යන්නයි.
(4) විසුද්ධිමග්ගය අයත් වන්නේ ඛුද්දකනිකායට ය යන්නයි.
(5) වඩාත් ම පැරණි යැයි පිළිගත හැක්කේ විමානවත්ථුව හා පේතවත්ථුව ය යන්නයි.

23. බුදුරදුන් විසින් තව්තිසා දෙව්ලොව දී අභිධර්මය දෙසනලද'යි සැලකේ. තව්තිසාවෙන් දඹදිවට වැඩම කළ බුදුරජාණන් වහන්සේ දෙවනුව එක් ප්‍රධාන ශ්‍රාවකයකුට අභිධර්මය දේශනා කළ බව සඳහන් වේ. ඒ අනුව ප්‍රථම ආභිධම්මික ශ්‍රාවකයා ලෙස දක්වෙන්නේ,
(1) සැරියුත් මහතෙරුන් වහන්සේ ය. (2) බක්කුල මහතෙරුන් වහන්සේ ය.
(3) අනුරුද්ධ මහතෙරුන් වහන්සේ ය. (4) ආනන්ද මහතෙරුන් වහන්සේ ය.
(5) මහාකස්සප මහතෙරුන් වහන්සේ ය.

24. ක්‍රිස්තුවර්ෂ පස්වන සියවසේ දී සිංහල අටුවා පාලි භාෂාවට පරිවර්තනය වූ බැව් ශාසන ඉතිහාසයේ සඳහන් වේ. බුද්ධ වචනය තවදුරටත් පැහැදිලි කිරීම එහි දී සිදුවිය. පාලි අටුවා පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි **නො වන්නේ,**
(1) පැරණි ථෙරවාදි ඇදුරු පරපුරෙහි පිළිගැනීම අනුව සම්පාදිත ය යන්නයි.
(2) පැරණි පෙළ දහමට සපුරා පටහැනි වේ යන්නයි.
(3) පැරණි ශ්‍රී ලාංකික සමාජය දැනහැඳිනගැනීමට ද උපකාරී වේ යන්නයි.
(4) භාරතීය ධර්මධරයන් මෙන් ම ශ්‍රී ලාංකික ධර්මධරයන් ද අටුවා සම්පාදනයට මූලික වූ බව පෙනේ යන්නයි.
(5) පාලි අටුවා සැපයීමට පෙර හෙළටුවා සම්පාදනය කොට තිබේ යන්නයි.

25. පාලි ත්‍රිපිටක ධර්මය නිවැරදි ව බොහෝ කාලයක් පවත්වා ගෙන යාමට ඇප කැප වූ ආචාර්ය පරම්පරා, භාණක යන පදයෙන් හැඳින්වුණු බව ඓතිහාසික මූලාශ්‍රය අනුව පැහැදිලි වේ. එම භාණකවරුන් අතරට **නොගැනෙන්නේ,**
(1) දීඝභාණක ය.
(2) අංගුත්තරභාණක ය.
(3) මාතිකාභාණක ය.
(4) ධම්මභාණක ය.
(5) විනයභාණක ය.

26. නිඝණ්ඨනාතපුත්‍රතුමා බුද්ධකාලයේ විසූ ශාස්තෘවරුන්ගෙන් කෙනෙකි. සුවිශේෂ දහමක් දේශනා කළ නිඝණ්ඨනාත පුත්‍රයන්ගේ ඉගැන්වීම් අතරට **නොවැටෙන්නේ,**
(1) සියල්ල පූර්ව කර්මයෙන් සිදු වේ යන්නයි.
(2) නිත්‍ය වූ ආත්මයක් ඇත යන්නයි.
(3) කර්මක්ෂය කිරීමට දුෂ්කර ව්‍රත පිරිය යුතු ය යන්නයි.
(4) බ්‍රහ්ම සහව්‍යතාව පරම විමුක්තියයි යන්නයි.
(5) කාය කර්ම මනෝ කර්මයට වඩා ප්‍රබල ය යන්නයි.

27. අග්ගඤ්ඤ සූත්‍රය මිනිස් සමාජයේ ප්‍රභවය හා පරිණාමය විවරණය කරයි. වෛදික සහ බ්‍රාහ්මණ මතවාද ද ශ්‍රමණ සම්ප්‍රදායට අයත් මතවාද ද බැහැර කරමින් වඩාත් විශ්වසනීය සමාජ පරිණාමයක් බුදුසමය හඳුන්වා දෙන්නේ එමගිනි. සමාජ පරිණාමය පිළිබඳ බෞද්ධ විවරණයෙහි **නො කියවෙන** කරුණක් වන්නේ,
(1) සමාජය පරිණාමයට පත්වූයේ විවිධ හේතු ප්‍රත්‍ය අනුව ය යන්නයි.
(2) සමාජ විෂමතාවලට සපුරා වගකිව යුත්තේ රාජ්‍ය පාලනය ය යන්නයි.
(3) පරිසරය හා මිනිස් චර්යා අන්‍යෝන්‍ය ප්‍රතිබද්ධ ය යන්නයි.
(4) සමාජ පරිණාමයට තුඩුදෙන සාධක සමහරක් ආධ්‍යාත්මික ය යන්නයි.
(5) සන්නිධිකාර පරිභෝගය සමාජ පරිණාමයේ ප්‍රතිඵලයක් වේ යන්නයි.

28. අනිත්‍ය වූ ධර්ම නිත්‍ය නොව අනිත්‍ය ය. දුක් සහිත වූ ධර්ම සුඛ නොව දුක් සහිත ය. අනාත්ම වූ ධර්ම ආත්ම නොව අනාත්ම ය. අසුභ වූ ධර්ම සුභ නොව අසුභ යැයි යථාභූත වූ අවිපරීත වූ දැක්ම ඇති පුද්ගලයා තුළින් ප්‍රකටවන චරිත ලක්ෂණයක් **නො වන්නේ,**
(1) ස්කන්ධාදි ධර්ම මගේය, මම වෙමි, මගේ ආත්මය වේ යැයි සිතා ක්‍රියා කිරීම ය.
(2) අසීමිත ආශාවෙන් තොරවීම ය.
(3) අටලෝදහමින් කම්පා නොවීම ය.
(4) අවම ඉච්ඡාවන් ඇතිව අපිස් පැවැත්මෙන් දිවි ගෙවීම ය.
(5) අන්තවාදයකට නොවැටෙන මැදහත් බව ය.

29. විශ්‍රාමිකයකුවන වීරසිංහ පරිසර හිතකාමියෙකි. පරිසරය රැකීමට හා පෝෂණය කිරීමට ඔහු ක්‍රියාකළේ තම දහම් දැනුමට අනුව ය. එම දැනුමත් ක්‍රියා පිළිවෙතත් ඔහු වෙත ලැබුණේ,
(1) අග්ගිවච්ඡගොත්ත සූත්‍රයෙනි.
(2) සිගාලෝවාද සූත්‍රයෙනි.
(3) වාසෙට්ඨ සූත්‍රයෙනි.
(4) අනත්තලක්ඛණ සූත්‍රයෙනි.
(5) වනරෝප සූත්‍රයෙනි.

30. පසුගිය පුන් පොහොද සිල් සමාදන් වූ උපාසක - උපාසිකාවන් සමග කෙරුණු ධර්ම සාකච්ඡාවක දී සිගාලෝවාද සූත්‍රය වෙත අවධානය යොමු විය. එහි පැවිද්දන් විසින් ගිහියන්ට නිවන්මග කියා දිය යුතු යැයි සඳහන් වන බව ආරියදාස උපාසක මහතා පැවසුවේ ය. එය අසා සිටි පන්සලේ පණ්ඩිත හාමුදුරුවෝ ආරියදාස උපාසක මහතා අදාළ සූත්‍රය නිවැරදි ව තේරුම් ගෙන **නැති** බව පෙන්වා දුන්හ. උපාසක මහතාගේ වැරදි අදහස නිවැරදි විය යුත්තේ,
(1) සිල් සමාදන්වීමට අනුබල දීම ලෙස ය.
(2) භාවනාවට උනන්දු කරවීම ලෙස ය.
(3) දිනපතා පන්සල් යාම ලෙස ය.
(4) දෙමව්පියන්ට ගරු කිරීම ලෙස ය.
(5) ස්වර්ග මාර්ගය පෙන්වා දීම ලෙස ය.

31. බුදු දහම පෙන්වා දෙන පරිදි දුක එක් අතකින් සන්තානගත ය. අනෙක් අතින් සමාජගත ය. සමාජගත දුක ජය ගැනීමට ද බුදු දහම මග පෙන්වයි. පහත දැක්වෙන ධර්මපාඨ අතුරෙන් එම දුක ප්‍රකාශවන ධර්මපාඨය කුමක් ද?
(1) සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා
(2) සබ්බෙ සත්තා මරිස්සන්ති
(3) උප්පාදො පඤ්ඤායති. වයො පඤ්ඤායති. ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති
(4) දලිද්දියං භික්ඛවේ දුක්ඛං ලොකස්මිං
(5) ඉති ඉමස්මිං කායෙ විවිධා ආබාධා උප්පජ්ජන්ති.

32. දුක්ඛ නිරෝධය භාෂානුසාරයෙන් පැහැදිලි කිරීම පහසු නො වේ. එය උපමානුසාරයෙන් දැකිය නොහැකි ය. එහෙත් භාෂාව නිවනෙහි ස්වභාවය දැක්වීමට ඇති එක ම මාර්ගයයි. පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවනෙහි ස්වභාවය යම් තරමකට කියවෙනුයේ,
(1) නිවන යනු බුද්ධාදි උතුමන්ගේ නිකෙලෙස් අත්දැකීමය යන්නෙනි.
(2) නිවන පාරලෞකික විමුක්තියකි යන්නෙනි.
(3) නිවන ආත්මාර්ථ සාධනයකි යන්නෙනි.
(4) නිවන පින්දහම් කිරීමේ අග්‍රඵලයයි යන්නෙනි.
(5) බුදුන් නොදැක නිවන් දැකිය නොහැකි ය යන්නෙනි.

[ පස්වෙනි පිටුව බලන්න.

33. ආර්ය මාර්ගයෙහි පදනම සීලයයි. බුද්ධඝෝෂ මාහිමියෝ ද ත්‍රිවිධ ශික්ෂාව විවරණය කෙරෙමින් පළමුව සීලය ම දක්වූහ. සසරදුක් නිමා කරලන්නේ සීලයෙහි පිහිටා සිත ද ප්‍රඥාව ද වැඩීමෙනි. සීල ප්‍රතිපදාව බුද්ධ වචනයෙහි දක්වා **නැත්තේ**,
(1) ඉන්ද්‍රියක් ලෙස ය. (2) පින්කිරියවතක් ලෙස ය. (3) පාරමිතාවක් ලෙස ය.
(4) ධනයක් ලෙස ය. (5) දැඩිව ගතයුතු ව්‍රත සමාදානයක් ලෙස ය.

34. සිරුරට කටුක දුක් පීඩා ගෙනදීමේ පිළිවෙත බුදුරදුන් විසින් විචාරයට ලක්කරන ලදී. එය සේවනය නොකට යුතු යැයි උන්වහන්සේ වදළහ. සිරුර තැවීමට අනුගමනය කෙරෙන පිළිවෙත්වල ප්‍රතිඵල හැටියට බුදුරදුන් පෙන්වා දුන් කරුණු අතරට **නොවැටෙන්නේ**,
(1) මෙලොව සැපත ද නැති කරයි. කටුක දුකක් ම වේ යන්නයි.
(2) පස්කම් සුවයෙහි ගිජු බව නැතිකර මිනිස් සිත පාලනය කරයි යන්නයි.
(3) එය දුක් සහිතය, අනාර්යය, අවැඩදායක ය යන්නයි.
(4) එමගින් ආර්යභාවය සාධනය කෙරෙන ඤාණ දර්ශනයක් නූපදී යන්නයි.
(5) චරිත සංවර්ධනය ඇතිකෙරෙන කුසල් දහම්හු නොවැඩෙත් යන්නයි.

35. දුක සහ දුක නැතිකිරීම පටිච්ච සමුප්පාදය අනුව පැහැදිලි කෙරෙන මූලික කරුණු ය. එහෙත් වෙනත් අතිරේක ප්‍රස්තුත විෂයයෙහි ද පටිච්චසමුප්පාද ධර්මය යොද ඇත. එමගින් පටිච්චසමුප්පාදයෙහි සර්වකාලීන විශ්ව ව්‍යාප්ත ස්වභාවය ප්‍රකට වේ. එම කරුණු අතරට වැටෙන්නේ,
(1) සිත දියුණු නොකිරීමෙන් සමාජ සබඳතා බිඳවැටෙන අයුරු දක්වීම ය.
(2) අකාර්යක්ෂම රාජ්‍ය පාලනය හා දරිද්‍රතාව ද හේතුවෙන් සමාජයෙහි දුසිරිත් බහුල වන බව පෙන්වා දීම ය.
(3) සමාධිය සීලයට උපකාරී නො වන බව පැහැදිලි කිරීම ය.
(4) සියලු දෘෂ්ටි පසෙක ලා සම්‍යක් දෘෂ්ටියෙහි එල්බ ගැනීමෙන් විමුක්තිය ලබාගත හැකිබව ප්‍රකට කිරීම ය.
(5) මැදුම් පිළිවෙත දුකින් මිදීමට පමණක් අදාළ වන බව දක්වීම ය.

36. 'සමථ' භාවනාව පිළිබඳ නොයෙක් විස්තර, පාලි ත්‍රිපිටකයේ දක්නට ලැබෙන විවිධ සූත්‍රවල සංග්‍රහ වී ඇත. සමථ භාවනාව හා බැඳුණු කරුණු පැහැදිලි කිරීමේ දී භාවිතයට ගෙන **නැති** ධර්ම පාඨයක් වන්නේ,
(1) කුසලචිත්ත එකග්ගතා සමාධි යන්න ය. (2) එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදතෙ යන්න ය.
(3) පීතමිද්ධා චිත්තං පරිසොධෙති යන්න ය. (4) විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති යන්න ය.
(5) පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති යන්න ය.

37. සීලවතී උපාසිකාව. දැහැමිව දිවි ගෙවන මාතාවකි. ඇය දිනපතා ටික වේලාවක් මෛත්‍රී භාවනාවෙහි නිරත වෙයි. කාර්යක්ෂමව සතුටින් දිවිගෙවන ඇය ප්‍රගුණ කරන මෙත් සිත නිසා ඇයට ලැබෙන අනුසස් අතර පරලෝ ජීවිතයට අදාළ වන්නේ,
(1) පාපී සිහින නොදැකීම ය. (2) ප්‍රසන්න පෙනුමෙන් අනුන් පැහැදවීම ය.
(3) මරණින් මතු සුගතියේ ඉපදීම ය. (4) දේවාරක්ෂාව ලැබීම ය.
(5) නුමුළාව කලුරිය කිරීම ය.

38. බුදු දහමට අනුව කුසලාකුසලකර්ම නිශ්චය කිරීමේ දී යොදගත යුතු නිර්ණායක දෙකක් ඇත. එනම් චේතනාවේ ස්වභාවය සහ ක්‍රියාවට අනුරූප විපාක ය. ඒ අතුරෙන් අනුරූප විපාක අනුව කුසලාකුසල නිශ්චය කිරීමට උගන්වා ඇති දේශනාවක් වන්නේ,
(1) සිගාලෝවාද සූත්‍රය ය. (2) අම්බලට්ඨිකා රාහුලෝවාද සූත්‍රය ය. (3) බහුධාතුක සූත්‍රය ය.
(4) සම්මාදිට්ඨි සූත්‍රය ය. (5) පත්තකම්ම සූත්‍රය ය.

39. සත්ත්වයා උපත ලබන සුගති හෝ දුර්ගති හෝ අප සතු සාමාන්‍ය දැනුමෙන් දකගත නොහැකි ය. ඒ සඳහා විශේෂ ඤාණාධිගමයක් අවශ්‍යය ය. එය චිත්ත සමථයෙහි ප්‍රතිඵල වශයෙන් උපදවා ගතහැකි අභිඥාවක් ලෙස ද සැලකේ. එය හැඳින්වෙන්නේ,
(1) දිබ්බසොතඤාණං නමිති. (2) ආසවක්ඛයඤාණං නමිති.
(3) පරචිත්තවිජානනඤාණං නමිති. (4) ආසයානුසයඤාණං නමිති.
(5) දිබ්බචක්ඛුඤාණං නමිති.

40. පුද්ගලයාගේ දියුණුව ද විමුක්තිය ද පූර්ව කර්මයට හෝ දෛවයට හෝ පිරි නොනැමිය යුතු බව බුද්ධ දේශනාවේ සඳහන් වේ. ඒවා අප්‍රතිහත ධෛර්යයෙන්, අධිෂ්ඨානයෙන් හා නොපසුබස්නා වීර්යයෙන් ක්‍රියා කිරීම මත රඳ පවතී. මේ තත්ත්වය ප්‍රකාශ **නො වන්නේ**,
(1) විරිය, පධාන, පරක්කම යනුවෙනි. (2) අග්ගට්ඨාන, ආලස්ස, අවස යනුවෙනි.
(3) අප්පමාද, බල, උට්ඨාන යනුවෙනි. (4) ආයාස, පුරිසකාර, වායාම යනුවෙනි.
(5) ථාම, අත්තකාර, අතිකාම යනුවෙනි.

41. පියසේන ත්‍රිවිධරත්නය විෂයයෙහි අවෙච්චපසාදය ඇත්තෙකි. එම ප්‍රසාදය දුර දිග සිතා විමසා සහේතුකව උපන්නකි. එබඳු සැදැහැවත්කම ඇතිකර ගැනීමට ඔහුට මග පෙන්වූයේ බුදු දහමෙහි එන,
(1) අන්ධවේණූපමාව ය. (2) සාරෝපමාව ය.
(3) චූල්ලහත්ථිපදෝපමාව ය. (4) සල්ලොපමාව ය.
(5) අග්ගික්ඛන්ධොපමාව ය.

42. ආජීව අෂ්ටමක සීලය, පඤ්ච සීලය මෙන් නිත්‍ය සීලයක් වශයෙන් පුරුදු පුහුණු කොට අඹුදරුවන් පෝෂණය කෙරෙමින් ගිහි ජීවිතය ගත කළ හැකි ය. එම ආජීව අෂ්ටමක සීලයෙහි අවසන් ශික්ෂා පදය හැර ඉතිරි ශික්ෂා පද හතෙන් කියවෙන්නේ,
(1) වැඩිහිටියන්ට පමණක් අදාළ ප්‍රතිපදාවකි.
(2) බ්‍රහ්මචාරී ජීවිතයකට කෙමෙන් යොමුවීමකි.
(3) පොහොය දිනවලට අදාළ නො වන සීලයකි.
(4) දස අකුසල්වල මුලට එන අකුසල් හතෙන් වැළකීමකි.
(5) නොකළ යුතු දේ නොකිරීමට වඩා කළ යුතු දේ මතක් කිරීමකි.

43. ආයු, වර්ණ, සැප, බල සහ ප්‍රඥා ලබාගත හැක්කේ පින් කිරීමෙන් යැයි බුදු දහම උගන්වයි. එවැනි පින්කිරියවත් දහයක් ඇත. ඒවායේ හත්වැන්න 'අපචායනයයි.' ඉන් ඉගැන්වෙන්නේ,
(1) පිදිය යුත්තන් පිදීම ය.
(2) අල්පේච්ඡ ජීවිතයක් ගත කිරීම ය.
(3) පස්කම් සැපතින් ඉවත්වීම ය.
(4) එකට එක නොකිරීම ය.
(5) නිවන් මගේ ඉදිරියට ම ගමන් කිරීම ය.

44. සතර අගතියෙන් යුක්ත තැනැත්තාගේ යසස අව පක්ෂයේ සඳ මෙන් අනුක්‍රමයෙන් පිරිහී යයි. සතර අගතියෙන් මිදුණු තැනැත්තාගේ යසස පුර පක්ෂයේ සඳ මෙන් අනුක්‍රමයෙන් වර්ධනය වෙයි. මෙසේ සඳහන් වන්නේ,
(1) ධම්මසංගණියේ ය.
(2) අරියපරියෙසන සූත්‍රයේ ය.
(3) විසුද්ධිමාර්ගයේ ය.
(4) සිගාලෝවාද සූත්‍රයේ ය.
(5) ධම්මපදයේ ය.

45. සිව්බඹ විහරණ බුදු දහමේ එන කේන්ද්‍රීය මානව සාරධර්ම සමූහයකි. ඒවා අප්පමඤ්ඤා යන පදයෙන් හඳුන්වා ඇත. සමාජ සම්බන්ධතාවල යහ පැවැත්ම ඇතිකරන මෙම සාරධර්ම පිළිබඳ උසස් ම ආදර්ශය බ්‍රහ්මයා වෙතින් ප්‍රකටවුණු බව භාරතීය විශ්වාසයයි. එහි 'මුදිතා' යනු,
(1) ප්‍රීතියෙන් වාසය කිරීම ය.
(2) අනුන්ගේ සැපත දැක සතුටුවීම ය.
(3) මුදු මොලොක් අයකු වීම ය.
(4) පව්කම්වලින් මිදී ජීවත්වීම ය.
(5) හැම අතින්ම සුඛිත මුදිත වීම ය.

46. කවර රටක වුව ද ආර්ථිකය ගොඩනැඟීමට රජය මැදිහත් වීම අත්‍යවශ්‍ය බව බුදු දහම පෙන්වා දෙයි. එහි දී රජයෙන් ඉටුවිය යුතු වැදගත් ක්‍රියාමාර්ග තුනක් කූටදන්ත සූත්‍රයේ සඳහන් වේ. ශ්‍රම සම්පත සංවිධානය කිරීම සහ ආර්ථික අභිවෘද්ධිය ඇතිකරන එම ක්‍රියාමාර්ග තුනෙන් **එකක්** නම්,
(1) සුදුසුසන්ට රැකියා ලබා දී සේවයට සරිලන වැටුපක පිහිටුවීම ය.
(2) සුදුසු ලෙස අයකරන බදු ප්‍රජා සංවර්ධනයට යෙදවීම ය.
(3) රටවැසියන් දැහැමි දිවිපැවැත්මකට හුරුකරවීම ය.
(4) ගොවිතැන අනිවාර්ය කොට නීති පැනවීම ය.
(5) උපයන ධනයෙන් කොටසක් ඉතිරි කිරීමට ජනයා පෙලඹවීම ය.

47. සසර දුක් සහිත වුව ද එහි සැප නැති බව බුදු දහමින් නොකියැ වේ. සියලු දෙනාට ම ලැබිය හැකි සැපවිශේෂ බුදු දහමේ සඳහන් වේ. කාමභෝගී ගිහියකුට මෙලොව දී ම ලැබිය හැකි සැප හතරක් ඇත. ඉන් පළමුවැන්න ප්‍රකාශ වන්නේ,
(1) සො න තස්සති කිංචි වාරෙමි අප්පං වා බහුං වා අධිගච්ඡති සුඛං යනුවෙනි.
(2) සුඛෙන සුඛං අධිගන්තබ්බං යනුවෙනි.
(3) සො භොගා මෙ අත්ථීති අධිගච්ඡති සුඛං යනුවෙනි.
(4) භොගෙ ච භුඤ්ජාමි පුඤ්ඤානි ච කරොමීති අධිගච්ඡති සුඛං යනුවෙනි.
(5) ද්වේ මෙ භික්ඛවෙ සුඛං ගිහිසුඛං ච පබ්බජ්ජාසුඛං ච යනුවෙනි.

48. ධනෝපායනය හා පරිභෝජනය පිළිබඳ මූලාශ්‍රයක් හැටියට රාසිය සූත්‍රය වැදගත් වේ. කාමභෝගී ගිහියන් අතුරෙන් බුදුරදුන්ගේ පැසසුමට ලක්වන්නේ කවරෙක්දැ'යි එම සූත්‍රයේ සඳහන් වේ. එහි ලා සඳහන් වන කරුණු අතර දක්නට **නො ලැබෙන්නක්** වන්නේ,
(1) පරිත්‍යාග කිරීම හා පින්දහම් කිරීම ය.
(2) සැහැසිකම් නොකොට දැහැමිව ධනය ඉපයීම ය.
(3) ධනයෙහි ගිජුවීමේ ආදීනව දකිමින් හැසිරීම ය.
(4) ඉපයූ ධනයෙන් තමා සැපවත්ව විසීම ය.
(5) පඤ්චබලි නමින් ගැනෙන පරෝපකාරයෙහි නිරත වීම ය.

49. බුදුරදුන් වදාළ දස සක්විතිවත් මගින් රජදරුවන්ගේ මෙහෙවර කෙබඳුදැ'යි කිය වේ. ප්‍රජාභිවෘද්ධිය ම අරමුණු කොටගත් එම දස **සක්විතිවත්වලින් එකක්** නම්,
(1) පැනවූ නීති නොකැඩීම ය.
(2) සියලු ජන කොටස්වලට ආරක්ෂාව සැපයීම ය.
(3) නැතිබැරි අයට දන් දීම ය.
(4) ක්‍රෝධ නොකිරීම ය.
(5) නොගැටෙනසුලු බව ය.

50. පැරණි ලක්දිව විසූ බෞද්ධ පාලකයෙක් අපරිහානීය ධර්ම අනුගමනය කිරීමට ක්‍රියා කළේ ය. එහෙත් හෙතෙම තිරිසන් සතුන්ට වඩා මිනිසුන් ශ්‍රේෂ්ඨ යැයි කියමින් තිරිසන් සතුන් සඳහා අභය භූමි ඇති නොකළේ ය. ඔහු විසින් කඩකරන ලද්දේ,
(1) රාජධර්මයකි.
(2) සක්විතිවතෙකි.
(3) පඤ්චසීලයෙන් එකකි.
(4) සංග්‍රහ වස්තුවකි.
(5) පාරමිතාවකි.

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

2044



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

බුද්ධ ධර්මය II
பௌத்தம் II
Buddhism II

41 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

උපදෙස්:

※ I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) බුදුරදුන් සැබවින් ම මිනිසකු වූ බවට සූත්‍රාගත නිදසුන් **දෙකක්** දක්වන්න.
(ii) උන්වහන්සේ ආශ්චර්යවත් මිනිසකු ලෙස සැලකෙනුයේ ඇයි දැයි පෙන්වා දෙන්න.
(iii) මහාප්‍රඥ යනු කුමක්දැයි පැහැදිලි කරන්න.
(iv) "යථාවාදී තථාකාරී" බුදු ගුණයට නිදසුන් **දෙකක්** සපයන්න.
(v) බුදුරදුන් අන්‍යයන්ට සවන්දුන් අවස්ථාවක් විස්තර කරන්න. (ලකුණු 20 යි.)

**2.** (i) බුදු දහම ශාස්වතවාදය පිටුදකින්නේ මන්දැයි විමසන්න.
(ii) මධ්‍යම දේශනාවක් ලෙස බුදු දහම හැඳින්වීමේ යුක්තිය පෙන්වා දෙන්න.
(iii) "බුද්ධ වචනය මානව කේන්ද්‍රීය ය" පැහැදිලි කරන්න.
(iv) උභයාර්ථ සාධනය යනු කුමක්දැයි විස්තර කරන්න.
(v) "පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි" යන්න අර්ථකථනය කරන්න. (ලකුණු 20 යි.)

**3.** (i) බෞද්ධ සංඝ සමාජයට සමකාලීන පැවිදි සමාජවලින් ලැබී ඇති ආභාස **තුනක්** දක්වන්න.
(ii) "භික්ඛු" යන්නට නිර්වචනයක් සපයන්න.
(iii) භික්ෂූන් සඳහා ආරාම ප්‍රතිග්‍රහණයට මුල පිරුණු හැටි පෙන්වා දෙන්න.
(iv) සේඛියා යනු මොනවාදැයි විභාග කරන්න.
(v) උපසම්පදාවේ විකාශය තහවුරු කෙරෙන නිදසුන් **දෙකක්** සපයන්න. (ලකුණු 20 යි.)

## II කොටස

**4.** (i) ප්‍රථම සංගායනාවට තුඩුදුන් ශාසනික වාතාවරණය විස්තර කරන්න.
(ii) ශාසන චිරස්ථිතිය උදෙසා එම සංගීතිය උපකාර වූ අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 20 යි.)

**5.** (i) වෛදික යාග විධිවල අරමුණු හා කාර්ය සංසිද්ධිය පෙන්වා දෙන්න.
(ii) යාගය පිළිබඳ බෞද්ධ ආකල්පය සාකච්ඡා කරන්න. (ලකුණු 20 යි.)

**6.** (i) "සබ්බෙ ධම්මා අනත්තා" යන්න ධර්මානුකූලව විවරණය කරන්න.
(ii) බුදුසමය ආත්ම දෘෂ්ටියට නොවැටී සත්ත්වයාගේ පැවැත්ම විග්‍රහ කළ අයුරු විමසන්න. (ලකුණු 20 යි.)

**7.** (i) භාවනාව පිළිබඳ ව ශ්‍රී ලාංකේය බෞද්ධයන් අතර ඇති දුර්මත **දෙකක්** ගෙනහැර දක්වන්න.
(ii) "දෛනික ජීවිතයේ සාර්ථකත්වයට ද භාවනාව උපයෝගී වේ." විමසන්න. (ලකුණු 20 යි.)

**8.** (i) දැහැමි පාලනය යනු කුමක්දැයි බුද්ධ වචනය අනුව පරීක්ෂා කරන්න.
(ii) රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්වලින් නූතන ලෝකයට ලබාගත හැකි ආලෝකය විමසන්න. (ලකුණු 20 යි.)

* * *